G.D.S.A.

THE GOVERNMENT DENTAL SURGEONS' ASSOCIATION

Professional Centre, No 275/75, Prof Wijesundara Mawatha, Off Bauddhaloka Mw, Colombo 7.
E-mail : gdsa@sltnet.lk | gdsanews@gmail.com Tel : 011 2508012 Fax : 2055103

T.U No. 599

PRESIDENT
Dr. Nadun Dhammika

HONY. GENERAL SECRETARY
Dr. Aruna Abhayawardhana

HONY. TREASURER
Dr. Shamil Pathmaperuma

2026 නොවැම්බර් මස 25 දින,

මාධ්‍ය නිවේදනයයි

2026 අයවැය යෝජනාවලියෙන් වෘත්තිකයන්ගේ ඉල්ලීම් නොසලකා හැර තිබීම සම්බන්ධවයි

2026 අයවැය යෝජනාවලිය මුදල් අමාත්‍ය සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා විසින් නොබෝදා එළිදක්වනු ලැබුවේ රටේ සුවහසක් වෘත්තිකයන් දැඩි අවමානයකට හා රැවටීමකට ලක් කරමිනි.

මෙම අයවැයෙන් මෙරට දන්ත වෛද්‍ය ප්‍රජාව දැඩි ලෙස නොසලකා හැර ඇති අතර, වෛද්‍යවරුන්ගේ DAT දීමනාව රුපියල් 25,000කින් ඉහළ නංවන බවට ප්‍රකාශ කළද එය ලබා දීමට යෝජනා කර ඇත්තේ අදියර දෙකකිනි. ඒ අනුව රුපියල් 12,500/= ක මුදලක් 2027 ජූනි මාසයේදීත්, ඉතිරි රුපියල් 12,500/= ක මුදල 2028 ජූනි මාසයේදීත් ලබා දීමට නියමිතය. අඩුම තරමින් 2027 ජනවාරි මාසයේදී කිසිදු මුදලක් ලැබෙන්නේ නැත.

එසේම, වැඩිවන සෑම රුපියලකින්ම බදු දැල් එලා නැවත අය කර ගැනීමට ආණ්ඩුව විවිධ ක්‍රමෝපායන් සැලසුම් කර ඇත. කෙසේ නමුදු, ආණ්ඩුවේ ඉදිරි ගමනේදී සුහදව තබාගත යුතු විධායක ශ්‍රේණි කිහිපයක පමණක් මනදොළ පිරෙන පරිදි සැලකුම් ලබා දී ඇති බව පෙනී යයි.

රජයේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් නියෝජනය කරන එකම වෘත්තීය සමිතිය වන රජයේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමය ලෙස අප මේ මොහොතේ ඉල්ලා සිටිනුයේ, අයවැය කාරක සභා අවස්ථාවල දී මෙම යෝජනාවලිය නැවත සලකා බලන ලෙසයි.

ඒ අනුව;

1. DAT දීමනාව කාලීනව යාවත්කාලීන කිරීමටත්,
2. ED දීමනාව (Extra Duty) ස්ථාවර අගයක් ලෙස ලබාදෙන ලෙසත්,
3. අයවැයෙන් වැඩි කළ රුපියල් 25,000ක මුදල අදියර දෙකකින් තොරව 2027 ජනවාරි මාසයේ සිටම සම්පූර්ණයෙන් ගෙවීමටත් කටයුතු කරන ලෙස අප රජයෙන් ඉල්ලා සිටින්නෙමු.

මේ කිසිදු කරුණක් ඉටු නොකොට අනුමත කරනු ලබන අයවැය යෝජනාවලියත් සමඟ ඉදිරියට යාමට රජයේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමය ලෙස අප කිසි ලෙසකින් එකඟ නොවන අතර, එය සිදු නොවන්නේ නම් එළඹෙන නොවැම්බර් 30 වන දිනෙන් පසු ක්‍රමික විරෝධතා මාලාවක් රජයේ දන්ත වෛද්‍ය සේවාව තුළ ඇති විශේෂඥ සායන, බාහිර රෝගී සායන සහ ප්‍රජා දන්ත සායන කේන්ද්‍ර කොටගෙන දියත් කිරීමට අප සංගමය තීරණය කොට ඇති බව රජයට අවධාරණය කරනු කැමැත්තෙමු.

විධායක කමිටුවේ අණ පරිදි,
මීට විශ්වාසී,

Dr. Aruna Abhayawadhana
Hony. General Secretary
Government Dental Surgeons' Association
No. 275/75,
Prof. Stanley Wijesundara Mw,
Colombo - 07.

වෛද්‍ය අරුණ අභයවර්ධන,
ගරු ලේකම්,
රජයේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමය
071 449 2678